සටහනක් ඔබ හමුවේ තබමි. ඒ උතුරේ යුද්ධයේදී මියගියා යයි සිතන, තවමත් අතුරුදහන් වූ ලැයිස්තුවේ සිටින මා දන්නා හඳුනන තරුණයෙකි. ඔහු අතුරුදහන් වූයේ එවකට යුධ සමයේ කොටි සංවිධානය අතින් විනාශ වූ පුනරීන් කඳවුරට පහරදුන් අවස්ථාවේ දී ය. ඔහු ඒ වනවිට එක් දරු පියෙකි. මේ වන විට මියගොස් ඇති ඔහුගේ මව් මෙන් ම, අදත් ඔහු වෙනුවෙන් වැලපෙන, බිරිඳ ද මගේ මතකයට එයි. තවමත් වීරයන්ගේ ලැයිස්තුවට ඇතුළත් වී නැතියයි මා සිතන, ඔහු ගැන මතකයන් හිත් තුළ පැළපදියම් කරගෙන ජීවත්වූ මියගොස් ඇති, මව් මට මතක් වෙයි. ඔත්පල ව ඔහේ බලාගත් අත බලාගෙන රෝගියෙක්ව සිටි ඇය, වරක් මට මුණ ගැසුණෝය.  දිනක් ඇය බැහැ දකින්නට මා ඇය සොයගෙන නිවසට ගියේය. ඒ කතාබහ අතරතුරේ දී මා දන්නා හඳුනන ඇයගේ පුතා පිළිබඳව කථාකිරීමට ඇය උනන්දු වූවාය.

"යුද්ධෙදි මැරිච්ච අපේ එවුන් වීරයෝ කරලා කවුරුත් සතුටු උනාට, ඒ වීරයාට වැඩියෙන් මගේ පුතා ජීවත්වෙලා මං ළඟ හිටියා නම් හොඳයි කියලා මට හිතෙනවා පුතේ. දැන් මං අබලන්. ඇස් පේන්නැති කන් ඇහෙන්නැති මගේ කටට වතුර ටිකක් දාන්න එකෙක් මං ළඟ නැහැ. මැරිච්ච වීරයට වැඩිය පුතෙක් විදියට ජීවත්වෙලා උ9  මං ළඟ හිටියනම් අද වෙනකොට මට මගේ කොල්ලා වීරයෙක් ළමයෝ" ඇයගේ දෑස්වල කඳුළුය. ඒ කඳුළු තවත් බොහෝ දෑ පවසයි. වීරයන් ඉල්ලන, වීරයන් අනුනුස්මරණය කරන කිසිවෙක් තමන්ගේ දරුවන් හෝ සැමියන් කිසි ලෙසකින් මිය යනවාට අකමැතිය. එහෙත් ඔවුන් අනෙකකුගේ මරණය වීරයන් ලෙසින් දකිමින්, පිළිම නෙලන්නට කැමතිය. පොලිස් භටයාගේ අනපේක්ෂිත මරණෙන් පසු පෝස්ටර්, බැනර්, කටවුට් වලින් ඔහුව වීරයෙක් කළ සියල්ලන්ගෙන්ම අප ඇසිය යුත්තේ එයයි.

මගේ අදහස අනුව නම් මිනිසෙකුට තවත් මිනිසුන් රොත්තක් ජීවත් කරවමින්, ඔහුද මැරෙන තුරා ජීවත්වීම තරම් තවත් වීරකමක් තිබේ ද? ඒ බව  පොලිස් භටයාගේ මරණය තුලින් මනාව ඔප්පු කරයි. අද ඔහුගේ මෙන්ම මරා දැමූ පාතාලයේ මංකොල්ලකරුගේ දරුවන්ට පියෙක් නැත. බිරිඳට සැමියෙක් නැත. සහෝදර සහෝදරියන්ට තවත් සහෝදරයෙකු අහිමි වී ඇත. ඇත්තෙන්ම මිනිසෙකුට වීරයකු ලෙස විරාජමානවීමට අවශ්‍ය නම් තවෙකෙකු නසා දැමීමට අවශ්‍ය නැත. ඒ බව එදා අපට ද්‍රෝහියන් වූ අප අතරම ජීවත් වූ ජනතාවක් විසින් මනාව ඔප්පුකොට තිබේ. ඒ ලුතිනන් කර්නල් රත්නප්‍රිය නැමැති චරිතය හරහාය. එදා කොටි සංවිධානයේ භූමියක්ව පැවති කිලිනොච්චියේ විපතට පත් ජනතාවගේ පුනුරුත්ථාපන කටයුතු නිසා ඔහුගේ වෙන්වීම වෙනුවෙන් ජනතාව හෙළූ කඳුළුවලින්  එම ජනතාව, ඔහු වීරයෙක් බවට පත්කර ඇති නිසාය. වෙන්වී මැරී වැටී ගලා ගිය රුහිරුවලට වඩා, ප්‍රියයන්ගේ නික්මී මෙන් කඩා හැළෙන කඳුල කෙතරම් අගනේද?. අප බිහිකළ යුත්තේ එවැනි විරුවන්ය. අපට අවශ්‍ය දෙමළ හෝ සිංහල හෝ මුස්ලිම් විරුවන් නොව ජනතාවාදී, මනුෂ්‍යත්වයේ සුවඳ විහිදුවන විරුවන් ය.

පොලිස් කොස්තාපල් වරයාගේ බිරිඳ ඉල්ලන එකම එක දේ එයයි. ඇය ඉල්ලන්නේ ආදරණීය සැමියෙක් පියෙක් මෙන් තම පවුලට මෙන්ම රටට ජනතාවට ආදරය කරන මිනිසෙකි. ආදරණීය වීරයෙක් ඉල්ලන්නේ නැත. කිලිනොච්චියේ ජනතාව ද කර්නල්වරයා අසල අඬා වැටෙමින් ඉල්ලුවේ වීරයන් නොවේ. නැවතත් වීරයන් ද්‍රෝහියන් බිහි නොවන මනුෂ්‍යත්වයයි. සාමය හා සංහිඳියාව යනු එයයි. පිළිම නෙළාගන්නට නොහැකිව පස් යට වැළලුනු විරුවන්ගේ දෙන මත පිළිම නෙළාගත් විරුවන් බර දරාගෙන විරාජමානව වැජඹෙන රටක, ඔවුන් අසල දණ නමාගෙන වීරත්වය අදහන ජනතාවක් තවමත් අපරටේ ජීවත්වෙයි. ඒ අතර අපිත් විරුවන් යයි කියාගනිමින්, තවමත් ජීවතුන් අතර සිටිමින්, අනුන්ගේ මළකඳන් උඩින් ප්‍රෝඩාකාරී වීරවත්වයක් පෙන්වමින්, අනාගතය පැහැපත් කරගත්, මුදල් කෝටි ගණන් ගසා කෑ පුද්ගලයන් ඔවුන්ව රවටයි.

නැවතත් වීරයන් නොඉල්ලන, ද්‍රෝහියන් බිහිනොවන රටක් උදාකර ගැනීමට දැන්වත් අප උත්සුක විය යුතුය.  එන්න එන්නම කුඩා වී, තමා වටා කැරකෙමින් හිරු සඳු වටා කැරකෙන මේ පොළොවට සහජීවනය සහ මනුෂ්‍යත්වය තරම් තවත් දෙයක් තිබේද?





සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au

